**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2020**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මතය**

**-------**

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්ගරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදිකිරීම් ව්‍යාපෘති 22 කට අදාලව 2019 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ එකතු වටිනාකම රු.32,200,139ක් වූ බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගෙවීම් කර නොතිබුණි. | ව්‍යාපෘති 22 න් 2 ක් සඳහා 2021 මුල් භාගයේදී ගෙවීම් කර ඇති අතර ව්‍යාපෘති 4 ක් සඳහා ඉදිකිරීම් අඩුපාඩු නිවැරදි කරන තෙක් වැඩ ඉංජිනේරු විසින් ගෙවීම නිර්දේශ නොකිරීම, ව්‍යාපෘතියේ අවසන් බිල්පතට ගෙවීම් කර නොතිබීම නිසා ගෙවීම් කර නොමැත.<br><br>ඉතිරි ව්‍යාපෘති 16 හි බිල්පත් නඩත්තු අංශය විසින් පරීක්ෂා කරමින් සිටී. | ප්‍රමාදයකින් තොරව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.68,492,160ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.205,502,778ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.137,010,618ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන රජයේ ප්‍රධාන ඉහළයාම හා ගිවිසුම්ගත සේවා,නඩත්තු හා මහපොල ශිෂ්‍යාධාර වියදම් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)විශ්වවිද්‍යාලයට ඉඩම් හා ගොඩනැගිලි සහ තොරතුරු තාක්ෂණ උපකරණ මිලට ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ රු. මිලියන 13.5 ක ප්‍රතිපාදන වර්ෂය අවසාන වන විටද අපේක්ෂිත කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | 2020 වර්ෂය අවසාන භාගයේ මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ විය. ඒ අනුව ඉදිරි කටයුතු සිදුවෙමින් පවතී. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |
| (ආ)විශ්වවිද්‍යාලයට ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් පන්නල හා කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පිළිවෙලින් 2013 හා 2016 වර්ෂවලදී එකතුව රු.17,513,750 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ඉඩම් පවරාගෙන නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් විසින් කුලියාපිටිය දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුව අවසන් වන තුරු ඉඩම අත්පත් කර ගැනීමට නොහැකි වී ඇත. ඉඩම් අත්පත් කර ගැනීම් පනතේ V වන වගන්තිය යටතේ ගැසට් නිවේදනයක් නිකුත් කර ඇති අතර ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකරමින් පවතී. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු නොපමාව කරගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසරකට වැඩි කාලයක සිට පැවතෙන සැපයුම් ණයහිමියන් තිදෙනෙකුට ගෙවිය යුතු එකතුව රු.11,062,012 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි. | අදාළ කාර්යයන් සඳහා පවතින අඩුපාඩු සකසා ගැනීමට අදාල ආයතන සමඟ සාකච්ඡා කර කටයුතු කරමින් පවතින අතර එම ගැටළු විසඳා ගැනීමෙන් අනතුරුව ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "The assessment of water and sediment quality and associated sea urchin of the gulf of manner coastline" ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් 2014 හා 2016වර්ෂවල රු.3,437,160 ක් ලබාදී තිබුණද ඉන් රු.1,170,721 ක මුදලක් පමණක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාල ව්‍යාපෘතිය නිමකර නොතිබූ අතර වසර 4 කට අධික කාලයක සිට රු.2,266,439 ක් ඌන උපයෝජිතව පැවතුණි. | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් ව්‍යාපෘතියක් සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරි මුදල සඳහා අදාල ව්‍යාපෘති භාර ආචාර්යවරිය විසින් අයවැයක් පිළියෙල කර ඇති අතර ඒ සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙහි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ලඟාකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුලියාපිටිය හා මාකඳුර පරිශ්‍රයේ රු.41,825,013 ක් වැයකර ඉදිකරන ලද නිල නිවාස 4 ක් 2019 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2021 පෙබරවාරි 17 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ඉදිකර ඇති ඇතැම් නිවාසවල මුළුතැන්ගෙයි යම් යම් වෙනස්කම් කිරීමට සිදුවීම නිසාත් අදාළ ගෘහභාණ්ඩ මිළදී ගැනීමේ කටයුතු ඉන් අනතුරුව ආරම්භ කල නිසාත් මෙම ප්‍රමාදය සිදුවිය. | අඩුපාඩු සම්පූර්ණ කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නේවාසිකාගාර සංකීර්ණයේ තොග විදුලි සැපයුම ලබාදීම සඳහා 2020 ජනවාරි 16 දින විදුලිබල මණ්ඩලය වෙත රු.4,293,155 ක් ගෙවා තිබුණද, වර්ෂය අවසාන වන විටත් එම කාර්ය නිම කර නොතිබුණි. | වෛද්‍ය පීඨයේ නේවාසිකාගාර සංකීර්ණය සඳහා ට්‍රාන්ස්පෝමරයක් ලබා ගැනීමට විදුලිබල මණ්ඩලය වෙත මුදල් ගෙවා ඇතත් අපේක්ෂා කල පරිදි සමාලෝචිත වර්ෂය තුළදී මෙම කාර්යය නිම කිරීමට නොහැකි විය. | කාර්ය නිමකර අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |